

# අභිරහස

නෙතුලි සෙහන්යා ගුණසේකර

# අභිරහස

නෙතුලි සෙහන්යා ගුණසේකර

# අභිරහස

කේ. නෙතුලි සෙහන්යා ගුණසේකර

කතෘ

## කතෘගේ වෙනත් කෘති

හරි හොඳ ලස්සන පැන්සල

කු/ ශාන්ත බර්නදෙත් ආදර්ශ මහා විද්‍යාලය
(ජාතික පාසල)- පොල්ගහවෙල.
7 ශ්‍රේණිය D

කෘතිය පල කරන දිනය - 2026.05.10

ISBN–978-624-211-074-5

# පිදුම

**මම ආදරේ...**

**මට ආදරේ...**

**හැමෝටම...**

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමයා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය.

දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපණතා සාරධර්ම මෙන්ම නිරමාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු රන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකරා වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික ඇමණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුහවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශශිකලා සේනාධීර,
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සරත් බී.එස්. අභයකෝන්,**
ආණ්ඩුකාරවරයා - මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහපතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයට ශිෂ්‍ය දියණිවරුන්ලා සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියළු දෙනාගේ විශිෂ්ඨ වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදි බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටි. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාවල විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලකෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ඒකමත් එක ගමක පුංචි දුප්පත් පවුලක් හිටියා. මේ පවුලෙ හිටියෙ අම්මෙකුයි, පුංචි දරුවො දෙන්නෙකුයි. එක දරුවෙක් පොඩි, අනෙක් දරුවා මේ පොඩි දරුවාට වඩා අවුරුදු දෙකකින් වැඩිමහල්. මේ දරුවන්ගේ පියා හෘදයාබාදයකින් මිය ගිහින්. පොඩි දරුවාගේ නම රෝස්. ලොකු දරුවාගේ නම ඇනා.



මේ ලොකු දියණිය ඇනා මානසික ආබාධයකින් පීඩාවට පත් වී සිටී. මවගේ නම ඇමලින් ය. ඇනා සිය පියා හෘදයාබාධයක් නිසා මිය ගිය බව දැනගෙන සිටියත්, රෝස් ඒ බව දැනගෙන හිටියේ නෑ. ඊට හේතුව වූයේ රෝස් මෙලොවට බිහි වී මාස කිහිපයකට පසුව මේ පියා මිය ගිය නිසාය.

ඇනාගේ පියා රැකියාවක් ලෙස කෙළේ මේසන් වැඩ. පියා මිය යන්නට පෙර පියාගේ අන්තිම කැමැත්ත වූයේ "ලොකු දියණියට කෙසේ වෙතත්, පොඩි සිඟිත්ති රෝස්ට හොඳට ඉගැන්වීමය". දැන් රෝස් ළඳරු පාසල් යන වයසේය. ඇමලින් තම සැමියාගේ කැමැත්ත වෙනුවෙන් කුඩා දියණියට හොඳින් ඉගැන්නුවා.

දැන් රෝස් ළදරු පාසැලට ගොස් මාස කිහිපයකි. රෝස් ටිකෙන් ටික වර්ධනය වුණා. කියන දේ අහන්න පුරුදු වුණා. ඒ වගේ තමයි රෝස් හිතන්නත් පුරුදු වුණා. තේරුම් ගන්නත් පුරුදු වුණා. ඒත් තාමත් රෝස් දන්නෑ එයාගේ තාත්තා කොහෙද කියලා. එයාට ඒ ගැන වැඩි දැනීමක් තිබුනෙත් නෑ. ළඳරු පාසලට ළමයින්ව භාරදෙන්න අම්මලා වගේම තාත්තලාත් පැමිණියා. ''රෝස්ගේ තාත්තා කොහෙද?'' ඇය දැන හිටියේ නැත. ''අනිත් ළමයින්ගේ තාත්තලා එනවා. ඇයි මගේ තාත්තා එන්නැත්තේ?'' රෝස් මේ විදයට හැමදාම හිතනවා. රෝස්ට හරිම දුකයි.

ඔහොම යද්දි ළදරු පාසැල අවසන් වී ඇය පාසලට පය තැබුවා. දැන් රෝස්, තාත්තා ගැන හිතලා හිතලා රෝස්ගෙ හිතත් හරි නෑ. රෝස්ට පාසැලේ කියල දෙන කිසිම දෙයක් තේරුම් යන්නෙත් නෑ. රෝස්ට තවත් මෙය දරාගන සිටීමට බැරිම තැන මවගෙන් මෙය අසා ගැනීමට අවශ්‍ය වූ හෙයින් රෝස් මේ ගැන මවගෙන් අසීමට තීරණය කලා.

"නමුත් ඇසුවොත් අම්මාගෙ හිත රිදෙයි" යනුවෙන් සිතා නැවත පය පසෙකට තැබුවා.

රෝස් තව දුරටත් මෙහෙම හිතන්න ගත්තා. "තාත්තා ගැන අම්මාගෙන් අහගන්න කළින් මම හොඳට ඉගෙන ගෙන තියෙන්න ඕනි. එතකොට අම්මගේ හිතත් රිදෙන් නැති වෙයිනෙ මං තාත්තා ගැන අහනකොට''.

මෙහෙම හිත හිතා යද්දි රෝස් දන්නෙම නැතුව දෙවන ශ්‍රේණියට ගොස් හමාරයි. දැන් මවට සතුටුයි.

"මගේ චූටි දූ දැන් ටිකක් ලොකුයි" මෙසේ මව හිතුව ද රෝස් සිටින ප්‍රශ්නය ගැන මව දැන සිටියේ නෑ.

රෝස් හිතා ගත්තා "මං පහ වසරට ගිහින් හොඳින් ශිෂ්‍යත්වය සමත් වෙනවාමයි" කියලා. එහෙම හිතුවට කාලය ගත වුනේ හෙමින්.

රෝස්ට මේ ගැන හරියට අමතකත් වෙනවා. ඒ තරමටම කාලය හිමින් ගත වුණේ. රෝස්ට පළමු වසරේ පාඩම් තේරෙන් නැති වුණාට, දෙවන වසරෙ තිබ්බ පාඩම් හොඳට තේරුණා. ලස්සන වටකුරු අකුරු, පැහැදිලි අත් අකුරු, පොතේ පිළිවෙලට හොඳටම ලිව්වා. මව මේ ගැන සතුටු වුණා.

දෙමව්පිය රැස්වීමේදී හැමදාම ගුරුතුමිය රෝස්ගෙ අම්මා ළඟට ගිහින් "රෝස් හරිම හොඳ දරුවෙක් දක්ෂ දරුවෙක්, හොඳට ඉගෙන ගන්නවා" ගුරුතුමිය වර්ණනා කළා.

මේ විදියට යද්දි තුන්වන වසරටත් පය තැබුවා. විශාල පඩිපෙළෙන් තවත් පඩියකට ඇය පය තිබ්බා. රෝස් තුන්වන ශ්‍රේණියෙත් හොඳින් ඉගෙනුම හැදෑරුවා. පළමු වසරේ හා දෙවන වසරේ විභාග නැති වුණාට තුන්වෙනි වසරේ විභාග ලියන්න තිබුණා. මේ විභාග මහා විශාල විභාග නොවෙයි. මේවා "වාර විභාග". වාරෙන් වාරෙට තියෙන විභාග. දින කිහිපයකට පෙර ගුරුතුමිය සියලුම ළමුන්ට පැවසුවා ''පළමු වන වාර විභාගය දැන් සූදානම් වෙන්න හැමෝම''.

''හැමෝම හොඳට පොත් පත් පාඩම් කරන්න''. ළමුන්ට ආදරයෙන් පැවසුවා.

නමුත් රෝස් ටිකක් මේ ගැන බය වුණා. රෝස් මේ ගැන අම්මට කිව්වා. අම්මා රෝස්ට කිව්වා "ඔයා බය වෙන්න එපා පුතේ. පුතාට හොඳට ලකුණු ගන්න පුළුවන්. බය වෙන්නැතුව හොඳට පාඩම් කරන්න".

රෝස් හැමදාම පාඩම් කරන්න කාල සටහනකුත් හදාගත්තා. කාලය ගත වුණා. පළමු වාර පරීක්ෂණය පැවැත්වුණා. දින කිහිපයකට පසු වාර පරීක්ෂණ

ළකුණු ආවා. රෝස්ට බයයි. පන්ති භාර ගුරුතුමිය හැම ළමයෙක්ගෙම නම්, ලකුණු සහ වෙනියා කියාගෙන කියාගෙන ගියා. එක පාරටම රෝස්ගෙ නම කිව්වා. ලකුණුත් කිව්වා. රෝස්ට හැම විෂයකටම ලකුණු 85 ට ඉහලින් තිබුණා. රෝස්ගේ ලකුණු කිව්වම සතුටු හිතුණා. ගුරුතුමිය එක පාරටම රෝස් පන්තියෙ පළමු වෙනියා කියද්දි ළමුන් ද අත්පොලසන්නාද දුන්නා. සතුට වැඩිකමට රෝස්ට ඇඩුනා.

පාසැල නිම වී නිවසට පැමිණි විගස රෝස් අම්මව හෙව්වා හෙව්ව හෙව්වා. බැරිම තැන ''අම්මේ.....'' කියලා කෑ ගැහුවා.

අම්මයි, රෝස්ගෙ අක්කයි වත්ත පහලට ගිහින් දර එකතු කරගෙන එන්න. අම්මට අමතක වෙලා තිබ්බෙ රෝස් ගෙදර එන වෙලාව. අම්මයි, ඇනයි ඉක්මනට දර ඔසවාගෙන ගෙදරට ආවා. ඇනා රෝස්ව හයියෙන් බදාගත්තා. රෝස්ගෙ බය නැති වුණා.

රෝස් ඇනාගෙන් ඇහුවා "අම්මා කෝ" කියලා. ඇනා අත දික්කරලා අම්මා එනවා කියලා පෙන්නුවා. අම්මා දර ටික බිම දාලා රෝස්ව බදාගෙන රෝස්ව සැනසෙව්වා. අම්මා රෝස්ව සැනසෙව්ව විතරයි රෝස් කඳුළු පිහිදාගෙන අම්මව බදාගෙන කිව්වා "අම්මෙ මං පන්තියෙ කී වෙනියාද කියලා කියන්න පුළුවන්ද?" කියලා, හැබැයි අම්මට හිතුන රෝස් කොහොම හරි පන්තියෙ පළවෙනිය වෙන බව. අම්ම දන්නෑ වගේ රෝස්ට කිව්වා. "මම දන්නෑ පුතේ, පුතා ම කියන්නකො බලන්න" කියලා.

රෝස් අම්මව හයියෙන් බදාගෙන කිව්වා "අම්මෙ මං පන්තියේ පළවෙනියා" කියලා හයියෙන් කෑ ගැහුවා. ඒ වෙලාවේ අම්මගෙ දෑස් දිලෙන මුතු කැට වගේ. ඒ ඇස් වලින් කඳුළු බිදු වැටුණා. රෝස් ඒ කඳුළු පිහදාලා රෝසුයි, අම්මයි, අක්කයි ගේ ඇතුලට ගියා. රෝස් කිසිම දවසක ඉස්කෝලෙ පන්තියෙ දෙවෙනියගෙන් පල්ලෙහට නම් ගියෙ නෑ. එක්කො පළවෙනියා නැත්නම් දෙවනියා.

කාලය ගෙවිල ගියා. දැන් රෝස් ගොඩක් ලොකුයි. දැන් එයාට සාමාන්‍ය පෙළ ලියන්න කාලය එළඹිලා. රෝස් බය නැතුව විභාගෙ හොඳට ලිව්වා.

ටික කාලයක් ගත වුණා. ලකුණු ආවා. රෝස්ට හැම විෂයටම හොඳ සාමාර්ථයක් ලැබුණා. ඒ නිසාම රෝස්ට උසස් පෙළ ලියන්නත් වාසනාව උදාවුණා. කාලය ගත වුණා. උසස් පෙළ ලියන්න කාලය එළඹුනා. විභාගය ලිව්වා. ටික කාලයක් ගියා. රෝස් ටිකක් බය වුණා. එයා හිතුවේ තමන්ට සාමාන්‍ය සාමාර්ථයකින් එහා යන්න බැරිවෙයි කියලා.

ලකුණු ආවා. රෝස් රත්වුණා. කොහොම හරි රෝස් ප්‍රතිඵලය බැලුවා. හොඳම හොඳ ප්‍රතිඵලයක්. විශ්ව විද්‍යාලයට යෑමට සුදුසු තරම් ප්‍රතිඵලයක් ලැබී තිබුණා. ඒ වෙලාවෙ රෝස්ගෙ දෑසට කදුළු බිදක් ඉනුවා. රෝස්ට ගොඩක් සතුටුයි. හැබැයි රෝස්ට ඒ සතුට තිබ්බෙ පොඩ්ඩ වෙලාවයි.

ඒ ඇයි දන්නවද?

ඒ ඇයි කියලා මතක් කර ගන්න අපිට මේ කතාවෙ මුලටම යන්න වෙනවා.

ඒ තමයි “රෝස්ගෙ තාත්තට මොකද වුණෙ?’’.

මේ ප්‍රශ්න මෙච්චර කල් රෝස් ඔළුවෙ තියාගෙන හිටියා. දැන් එයාගෙ ඔළුවෙ මේ ප්‍රශ්ණෙ හැමතැකම සැරිසරන්න ගත්තා. එයාව පීඩනයට පත් වෙන තරම් එයාගේ ඔළුවෙ මේ ප්‍රශ්නෙ කැරකෙනවා. හැබැයි එහෙමයි කියලා එයා එයාගෙ ප්‍රථිඵලය අම්මට කියන්නැතුව හිටියෙ නෑ.

එයා ටික වෙලාවකට ඒ ප්‍රශ්නෙ කොහොම හරි අමතක කරලා උඩ පැන පැන ගිහින් හයියෙන් කෑ ගහලා කිව්වා “අම්මෙ මං පාස්” කියලා.

අම්මගෙ හිතට ඒ වෙලාවෙ දැනුන සතුට කියා ගන්න බෑ. අම්ම කෙනෙක්ට මේ වගේ විභාගයකින් ලැබෙන්න තියෙන උපරිම ලකුණු තමන්ගෙ දරුවට තියෙනව කියලා දැනුනම අම්ම කෙනෙක්ට කොච්චර සතුටු ද?

ඉතින් ඒ වගේ තමයි මේ රෝස්ගෙ අම්මටත් දැනුන සතුට "අවුරුද්දට කිරි ඉතිරෙනවා වගේ" රෝස්ගෙ අම්මගෙ සතුට දෝරෙ ගලනවා. අම්ම රෝස්ව හිරකරගෙන බදාගත්තා. රෝස්ගෙ අම්ම රෝස්ගෙන් ඇහුවා ''ඔයාට මගෙන් මොනවද ඕනෙ?'' කියලා.

රෝස් ටික වෙලාවකට අමතක කරලා ඉන්න හදපු ප්‍රශ්නෙ ආයෙ මතු වුණා. රෝස්ගෙ මුණෙ තිබ්බ සතුට කොහේ ගියාද රෝස්වත් දන්නෑ. රෝස් හිමීට මුහුණ බිමට හරව ගත්තා. අම්මා රෝස්ගෙ ඔළුව අතගාලා "ඇයි පුතේ මොකද්ද ප්‍රශ්නෙ? ඔයාට ඕනෙ මොනවහරි ලොකු දෙයක්ද? කමක් නෑ පුතේ ඔයාට මං කොහොම හරි අරන් දෙන්නම් කියන්න පුතේ කියන්න" කියමින් අම්මා බැගෑපත් වුණා.

රෝස්ගෙ දෑස් වලින් කඳුළු වැටෙන්න පටන් ගත්තා. අම්ම බය වුණා. රෝස්ට මොකක් හරි කරදරයක්වද්ද කියලා. "පුතේ කියන්න කරදරයක්වත්ද?"

රෝස් එතකොට මෙහෙම කිව්වා. "නෑ මට කරදරයක් නම් නෑ ඒත් මේ......." රෝස් වචන පටල පටල කිව්වා.

මොකද මේක එකපාරටම අම්මට කියන්න ගියොත් කොහොමත් දැනගන්න වෙන්නෙ නැති නිසා රෝස් මෙහෙම කිව්ව.

"අම්මෙ මට කරදරයක් නම් නෑ හැබැයි ලොකු ප්‍රශ්නයක් තියෙනවා" ඒක මං ඔයාට හෙට කියන්නම්" රෝස් කිව්වා.

ඒ අතර තුරදී අම්මත් කිව්වා "පුතේ මටත් ඔයාට කියන්න ලොකු දෙයක් තියෙනවා"

රෝස් ඒ විගස අම්මට පැවසුවා “ආ... ඔයාට කියන්න තියෙන දෙයක් හෙටම කියන්න, එතකොට අපිට අපේ මේ කතා එක දවසින්ම කතා කරගන්න පුළුවන්”

ඒත් අම්මාට මේ කථාව කියන්නමයි හිත. ඒත් රෝස් කියන නිසා හෙටම කියනවා කියලා හිතුවා.

රාත්‍රී කෑම වේල ගෙන තිදෙනාම නින්දට ගියා.

පසුදා උදාවුණා. අම්මා උදෑසන්නම නැඟිට උයන්නට වුණා. අම්මා උයනවිටත් කල්පනාව, ''මම කොහොමද මේ කතාව කියන්නේ?'' අම්මට මේ ප්‍රශ්ණ ටිකක් පැටලිලි සහගතයි. අම්මා කල්පනා කළා.

''මම මේක දැන්ම කියන එකද හොඳ රෑ නැත්නම් තව ටිකක් කල් ගිහින් කියන එකද හොඳ?''

අම්ම මේ ගැන කල්පනා කළා. මේ අතරේ රෝස් නැඟිටලා කුස්සියට දුවගෙන ආවා. අම්ම හොඳටම කල්පනාවක රෝස් දැක්කා. රෝස් දුවගෙන ආවේ මොනව හරි කරවෙන ඇවිත් බලද්දි පරිප්පුව කරවෙලා. රෝස් ඉක්මනට ලිපේ තිබ්බ දර ටික අයින් කරලා කරවුණ ඇතිලියට වතුර දැම්මා.

රෝස් අම්මට හයියෙන් කතා කරා “අම්මේ..... මේ පරිප්පු හොඳටම කරවෙලා මොකද මේ?”

අම්ම එක පාරටම ගැස්සිලා ගියා.

“ආ පුතේ...... මේ...... මට.....” අම්මට වචනත් පැටලුණා.

“අනේ පුතේ පරිප්පුව කරවෙලාද? මං පොඩි කල්පනාවක හිටියෙ පුතේ” අම්මා කිව්වා



"පොඩි කල්පනාවක නම් නෙමෙයි ඉදලා තියෙන්නෙ මොකද්ද අම්මෙ ප්‍රශ්නෙ?"

එවිට අම්ම මුකුත් ම නොකියා ''මුකුත් නෑ පුතේ'' කියලා දෙන්නම සද්ද නැතුව හිටියා.

ටික ටික දවල් වුණා. දැන් රෝස්ගෙ හිතේ තියෙන්නෙම අම්මට මේ ගැන කියන එක හිතේ තියෙන්නෙම ඒක විතරමයි. රෝස් කල්පනා කර කර ගියේ කෙලින්ම ඉස්තෝප්පුව ළඟට ඉස්තෝප්පුව ළඟට යද්දි හිටියෙ අම්මයි, ඇනයි, රෝස් මේක දැක්ක විගස එයාට හිතුනෙ අක්කව කෝමහරි එතනින් යවල අම්මත් එක්ක මේ ගැන කතා කරන්න රෝස් එහෙම හිතපු විදිය තවත් ලේසි වුණා. ඇනා එතනින් නැගිටලා යන්න ගියා. රෝස් හිමීට ඒ පිටිපස්සෙන් ගිහින් ඇනා කොහෙටද

යන්නෙ කියලා බැලුවා. ඇනා ගියේ නිදාගන්න. රෝස්ට හිතුණා ''මේක තමා හොඳම වෙලාව අම්මට මේ ගැන නිදහසේ කියන්න''. ඉක්මනට යන්න ඕන කියල හිතපු රෝස් ඉස්තෝප්පුවට ගියා.



රෝස් හිමීට මේ දේ පැහැදිලිව අම්මට කීවා. අම්ම පුදුමු වුණා.

''පුතේ මමත් ඔයාට මේ ගැනම තමයි කියන්න හිටියෙ'' රෝස් විශ්මයට පත් වුණා.

ඒත් අම්මට ප්‍රශ්ණයක් තිබ්බා. ඒ තමයි ''රෝස් දැන් ලොකු වයසේ. එයාට මේවා තේරෙන වයසක් තියෙන්න ඇති. ඇයි එයා මේක දැන් අහන්නෙ. මීට කලින් මේ ගැන අහනන් තිබුණානෙ?'' කියලා. අම්මා මේක රෝස්ට කිව්වා.

රෝස් කිව්වා ''මම මේ ගැන ඒ කාලේ ඉදන්ම ඇහුවෙත් අම්මා මට මේ ගැන කියන්නෙ නැති වෙයි ''එහෙම හිතලයි මම හොඳ සාමාර්ථයක් අරන්ම මේ ගැන අහන්න හිතුවේ.

අම්මා රෝස්ට ඇත්තම විස්තරය කිව්වා. ඒත් රෝස් මේක ගැන පිළිගත්තේ නෑ. එයාට මේ කථාවේ මොකක් හරි සැකයක් තිබුණා.

අපි බලමු මොකක්ද මේ සැකය කියලා.

ටික කාලයක් ගත වුණා. දැන් රෝස් විශ්ව විද්‍යාලයට යනවා. සාමාන්‍ය විශ්ව විද්‍යාලයක අවුරුදු 4ක් වත් ඉගෙනීම් කටයුතු කරන්න තියෙනවා. ඉතිං මේ රෝස් පළවෙනි අවුරුද්ද තමා දැන් මේ ගෙවන්නේ.

මේ අතරෙ රෝස්ගෙ අක්කා ඇනාටත් ගෙදර නිකංම ඉදලා බෑ කියලා, අම්මා කියලා දුන්නා පැදුරක් වියන හැටි, පන් පෙට්ටියක් වියන හැටි. මේ වගේ පොඩි පොඩි අත්කම් නිර්මාණ කරන්න පුරුදු වුණා.

ඇනා මේක ලොකුවටම කරගෙන ගියා. මේක දැකපු රෝස් අම්මත් එක්ක කථා කලා ඇනාගේ මේ අත්කම් නිර්මාණ පොඩි ගණන් වලට විකුණන්න. ඒත් අම්ම මේකට කැමති වුණේ නෑ. ගමේ පූසො වගේ හිටපු එවුන් දැන් දියුණු වෙන්න හදනවා කියල කතා හදයි කියලා. මෙච්චර කල් සද්ද නැතිව ඉදලා අපි ඕව කරන්න ගිහින් බොරු කතා අහගන්න වෙනව කියලා අම්මා කිව්වා.

ඊට පස්සෙ රෝස් හිතුවා, රෝස් යන විශ්ව විද්‍යාලයේ ඉන්න යාළුවන්ට මේවා විකුණන්න. රෝස් ඒ ගැනත් අම්මට කිව්වා. ඒත් අම්ම ඒකට කොහොමත්ම කැමති නෑ. ඒ නිසා රෝස් ඒ ගැන අයෙ හිතුවෙත් නෑ.

ටික කාලයක් ගත වුණා.....

දැන් රෝස් මේ ගෙවන්නේ විශ්ව විද්‍යාලයේ දෙවන අවුරුද්දයි.

රෝස් ගෙදර එන්නේ සති අන්තෙ. රෝස් දෙවැනි අවුරුද්දේ භාගයක් වගේ යද්දී රෝස් හැදුණු වැඩුණු ගමේ එක එක කථා හැදෙන්න පටන් ගත්තා. කථා හැදුනත් රෝස්ගෙ මේ පුංචි පවුලට. ඒත් මේ ගෙදර කවුරුත් දන්නෑ මේ ගෙදර අයට තමයි කතා හැදෙන්නෙ කියලා.

රෝස්ගෙ විශ්ව විද්‍යාලයේ, අවුරුද්දට මාසයක නිවාඩු දෙනවා. ඉතින් රෝස් සති අන්තයේ නිවාඩුවක් අරගෙන ගෙදර ගියා. රෝස්ගෙ ගෙදර ළඟම ගෙවල් කීපයක් තියෙනවා. ඉතින් ගෙවල් දෙකක ගෑනු දෙන්නෙක් මොනවාදෝ කතා කර කර හිටියා.

කලිනුත් අපි කතා කරේ රෝස්ගෙ පුංචි පවුලට මේ ගමේ අය කතා හදනවා කියලා. රෝස්ට සැක හිතුනා, රෝස්ලට තමා මේ කතා හදන්නෙ කියලා. කොහොම හරි රෝස් ගහකට මුවාවෙලා මේ ගෑනු දෙන්නා කතා කරන දේවල් අහගෙන හිටියා. අහගෙන ඉන්නකොට, කතා කරන්නේ රෝස්ගෙ තාත්තා ගැන. කලිනුත් අම්මගෙන් මේ ගැන අහද්දී එයාට පොඩි සැකයක් තිබ්බනෙ.

මොකද අම්ම පස්සේ රෝස්ට කියල තියෙනව තාත්තා මේසන් වැඩ කලාට තාත්තා මේසන් වැඩ කළේ දවස් දෙකයිලු. දවස් දෙකකින් ගල් උස්සලා පපුවෙ අමාරු හැදෙන්න විදියක් නෑනේ. අනික පළවෙනි දවසේ ගල් උස්සල නෑලු. දෙවනි දවසෙ සිමෙන්ති අනල තියෙන්නේ උදැල්ලෙන්ලු. උදැල්ල එක පාරටම තියුණු විදියට කකුලෙ වැදිලා රෝහල් ගත කරලලු. ඊට පස්සෙ රෝස්ගෙ තාත්තාව භාර වෛද්‍යවරයා කියල "තුවාලෙ ගැඹුරටම හැරිලා තියෙන්නෙ ඒ නිසා රෝහලේ තුවාලෙ හොඳ වෙනකන් තියන්න" කියලා. ඒ වෛද්‍යවරයා කිව්ව විදයට තුවාලෙ හොඳ වෙනකන් ඉස්පිරිතාලෙ තියාගෙන ඉවර වෙලා රෝස්ගෙ අම්මා තාත්තව බලන්න රෝහලට එද්දි තාත්තා මැරිලා කියලා. හැබැයි මිනිය ගෙදරට ගෙනල්ලත් නෑ තාත්තා මැරිල කියල කියල තියෙන්නෙත් වෙන දොස්තර කෙනෙක්ලු.

කොහොම හරි අර ගෑනු දෙන්න කතා කර කර ඉදල තියෙන්නෙ ආයෙමත් රෝස්ගෙ තාත්තා ගමට ඇවිල්ල කියලා. රෝස්ට මේ කතාව ඇහුනා. ඇහුන ගමන් රෝස්ගෙ ඇඟ සීතල වුණා.

රෝස්ට මේ කතාව හරිම පැටලිලි සහගතයි. මේ කතාව ඔලුවෙ තියාගෙන ගෙදර ගියා. ගෙදර ගිහින් බලනකොට වෙන්න තියෙන හොඳම දේ වෙලා ඉවරයි.

රෝස්ගෙ අම්මගෙ අන්තිම හුස්ම ටිකක් ගිහින්.......

ගොත ගහන පොඩ්ඩ පෙඩ්ඩ කතා කල හැකි ඇනා, ගමේ ගෙවල් ගානෙ ගිහින් විස්තරේ ගොත ගගහ කියල මුළු ගමම ගෙදරට එක්ක ආවා. රෝස් ගෙදර යනකොට ගමේ හැමෝම රෝස්ගෙ ගෙදර වට වෙලා. ගමේ හැමෝම රෝස්ලට ඇනුම් පද කිව්වත් එකම එක්කෙනෙක් ඉන්නවා මොනවත් කියන්නැති. ඒ තමයි රෝස්ලාගෙ ගෙට අල්ලපු ගෙදර අය. ඒ අය රෝස්ලත් එක්ක හරිම හිතවත්. ඕනෙම දුකකට සැපකට ඉන්නවා. දුවල ගිහින "මොකද මෙතන වෙන්නෙ?" කියලා අල්ලපු ගෙදර අයගෙන් ඇහුවා.

ඇහුවාම අල්ලපු ගෙදර අය කිව්ව, ඇනා ඇවිත් මුළු ගමටම කිව්වා "අම්මට සිහිය නැතිවෙලා වැටුණා කියල" රෝස් බය වුණා.

හැබැයි රෝස් දන්නෑ අම්ම මැරිලා කියලා. රෝස් විතරක් නොමෙයි. ගමේ එක්කෙනෙක්වත් දන්නෑ රෝස්ගෙ අම්ම මැරිල කියල. රෝස් ඇහුවා "කෝ දැන් අම්ම කියලා?". අල්ලපු ගෙදර නැනද කිව්වා "අම්ම දැන් ඉස්පිරිතාලෙ එක්ක ගියා" කියලා.

රෝස්ට හිතාගන්න බෑ මොකද්ද මේ සිද්ද වුණේ කියලා. හවස් වෙන්නත් කිට්ටුයි. ගම්වාසී සියල්ලෝම ගෙවල් වලට විසිර ගියා. ඉතුරු වුණේ අල්ලපු ගෙදර අය විතරයි. අල්පු ගෙදර නැන්ද කිව්ව "දැන් මෙහෙ කවුරුන් නෑනෙ උඹල දෙන්නට විතරක් ඉන්නත් බෑනෙ උඹල යං අපේ ගෙදර". රෝස් කිව්ව "ඕනෙ නෑ නැන්දෙ බයක් නෑ ඉන්න පුළුවන්" කියල. අල්ලපු ගෙදර නැන්දත් ගියා. රෝස්ට පිස්සු වගෙ.

රෑ වුණා කෑම හදන්නත් ඕනෙ කියල හිතපු රෝස් ඇනාවත් එක්කගෙන කුස්සියට ගියා.

ඇනාට මානසික අබාධ තිබ්බට උයන්න පියන්න හරිම දක්ෂයි. ඒ හින්ද රෝස් ඇනාටත් කියල දෙන්නම උයන්න ගියා.

මේ උයන අතරෙ උනේ පුදුම හාස්කමක්. හිතන්න පුළුවන්ද මොකද්ද හාස්කම කියලා?

ඔන්න බලන්නකෝ උයන අතර මඟදී ඇනා රෝස්ට කතා කරා "අක්කෙ" කියල. රෝස් ඇහුව ඇයි කියලා. ඇනා ගොත ගොතා කිව්ව "බය වෙන්න නම් එපා අක්කෙ මං ඔයාට සේරම විස්තරේ කියන්නං" කියල.

රෝස්ට මේ කිව්ව එක තේරුනේ නෑ ඒත් රෝස් කිව්ව "හරි කමක් නෑ කියන්නකො" කියල. ඇනා හොඳ අපූරුවට කතා කලා. මානසික ආබාදෙකුත් නෑ. ගොත ගැහිල්ලත් නෑ. ඇනා ආයෙමත් රෝස්ට කිව්ව. බය වෙන්න එපා කියලා.

රෝස්ගෙ අතේ තිබ්බ පිහිය බිමට වැටුණා. රෝස් බය වුණා. රෝස්ට වචන පැටලුනා

"අක්කෙ ඔයා කොහොමද මේ හොඳට කතා කරන්නෙ අම්ම කීවෙ මේ ඔයාගෙ උපන් හැටි කියලා, කොහොමද ඔයා කාලයක් මෙහෙම රඟපෑවේ. අනික කොහොමද පොඩි කාලෙ ඉදන් මේ රඟපෑම කරන්නෙ? ඔයාට පොඩි කාලේ තේරෙන්නෙත් නෑනෙ මෙහෙම රඟපාන්න"

රෝස්ට ප්‍රශ්න වැලයි. ප්‍රශ්න වැලක් තියෙන එක සාධාරණයි. ඇයි ඉතින් පරණ වෙච්ච ගල් පිළිමෙකට පණ ආවා වගේනේ. රෝස් එහෙම ප්‍රශ්න වැලක් අහල තත්පර දෙකක් ගියෙ නෑ රෝස්ට එක පාරටම සිහිය නැති වුණා. ඇනා පැනල රෝස්ව අල්ලගෙන පුටු දෙකක් තියල රෝස්ව හාන්සි කරා. හාන්සිකරල ඇනා

රෝස්ට කතා කලා. "නංගී නංගී නැඟිටින්න කෝ" ඇනා ඉක්මන්ට වතුර කෝප්පයක් අරගෙන වතුර ටික ටික මුහුණට ඉස්සා. රෝස්ට ටික ටික සිහිය ආවා.

එවෙලෙ තමයි ඇනාගෙ ඇඟට ලේ ටිකක් ඉනුවෙ. රෝස් ඉක්මන්ට ඇනා ගාවින් ඈත් වුණා. ඇනා ඇහුව "ඇයි නංගි බයවෙලා මේ මම අක්කා බය වෙන්න එපා මං ඔයාට ඊකනෙ කිව්වෙ බය වෙන්න එපා කියලා හිතට ධෛර්‍යය ගන්න. බය වෙන්න එපා. මේ මං මෙච්චර කල් කලේ බොරුවක්"

රෝස්ට හරි පුදුමයි. රෝස් කිව්ව "අක්කෙ ඔයා මේ හෙඳට කතා කරන්නෙ කොහොමද ඔයා මෙහෙම බොරු කරන්නෙ?"

ඇනා කිව්වා "මං ඔයාට සේරම කියන්නං"

රෝස් සේරම අහං හිටියා අපිත් දැන් ඒ කතාවට අහමු.

"මට පොඩි කාලේ මේ මානසික ආබාධය තිබුණා. ඒත් ඒක තිබ්බෙ පහ ශ්‍රේණියට යනකල් විතරයි. මම දන්නෑ මට පහ වසරෙදි මේ මානසික ආබාධයෙන් වැළැක්වුනේ කොහොමද? කියලා. සාමාන්‍යයෙන් මානසික ආබාධ කාලයක් යද්දි හරියනව නැත්නම් ජීවත් වෙලා ඉන්නකල්ම තියෙනවා. ඒත් මට එකම එක දෙයක් මතකයි. ඒ තමා අම්මයි මායි ඔයයි ගියා දොස්තර ළඟට ඔයාට මතක නැද්ද නංගි?. එතකොට ඔයා හතර වසරෙ මතකද? මතක් කරල බලන්න" ඇනා කිව්වා.

රෝස් මතක් කලා ඒත් රෝස්ට මතක් වුණේ නෑ. ඇනා කතාවේ ඉතුරු ටිකත් කීවා.

"ඉතින් මාව දොස්තර ළඟට එක්ක ගියාම දොස්තර මහත්තය කීවා මේ ළමයා ජීවත් වෙලා ඉන්නකං මේ මානසික ආබාධය හරි යන්නෙ නෑ කියලා. ඒ කතාව හරියට හරිද කියල බලන්න දුර පළාතක දොස්තර කෙනෙක් සම්බන්ධ කරලා ඒ දොස්තරගෙනුත් ඇහුවා. ඒත් දොස්තරත් කීවේ ඒ ටිකම තමයි. පරීක්ෂණයක් කරා

ඒත් ඒ ටිකම තමයි. ගුරුකමුත් කරා කරන්න පුළුවන් හැමදේම කරා ඒත් කියන්නේ ඒ ටිකම තමයි"



රෝස් ඇහුවා "එතකොට ඔයා කතා කරේ? ඒක මම දන්නෑ කොහොම හරි ඉතින් කතා කරානේ. ඒ විතරක් යෑ මානසික ආබාධෙත් හරි ගියානෙ. හරි හරි ඉතින් හෑලි ඕනෙ නෑ කියන්නකො එතකොට තාත්තට මොකද වුණේ?"

"ඒත් ඒක මට හරියටම මතක නෑ"

"ඒ ඇයි" රෝස් ඇහුවා.

“මොකද මට පහ වසරෙන් මානසික ආබාධයෙන් පීඩාවට පත් වෙලානෙ හිටියෙ. අයියෝ ඔයා නං” රෝස් කිව්වා.

“මං මොනවා කරන්නද? එතකොට ඇයි ඔයා පහ වසරෙදි මානසික ආබාධයෙන් වැළැක්වෙලා ඉදලා අම්මට කිව්වෙ නැත්තෙ?” රෝස් ඇහුවා.

“ඒ ඇයි දන්නවාද? අවුරුද්දකට වඩා වැඩි එක්කෙනෙක්ටයි අවුරුද්දකට වඩා අඩු එක්කෙනෙක්ටයි උගන්වන්න වත්කමක් නැති නිසයි”

“ඉතින් ඔයා ඉස්කෝලෙ ගියේ?” රෝස් ඇහුවා

“ගියා තමයි. ඒත් මම උදේට හැමදාම ඇඩුවා ඉස්කෝලෙ යන්න බෑ කියලා” ඇනා කිව්වා.

“ඉතිං ඉතිං ඊට පස්සෙ?”

මාව ඉස්කෝලෙ ඇරියෙ නෑ. දවසක් අම්ම අඬ අඬා හිටියා. අම්ම මොකද කියන්නෙ කියල මං කන් දීගෙන අහගෙන හිටියා. අම්ම එවෙලෙ කිව්වෙ “දෙන්නෙක්ට උගන්වන්න තරං මට කොහොමද සල්ලි හම්බ කරන්නේ” කියලා.

“ඉතිං ඊට පස්සෙ තමයි මම ඉස්කෝලෙ නොයා ඔයා ගැන හිතල ඔයාට ඉස්කෝලෙ යන්න අවස්ථාව දුන්නෙ”

රෝස්ගෙ ඇස් වලට කඳුළු පිරුණා. රෝස්ට තව ප්‍රශ්ණයක් තිබ්බ ඒ මොකක්ද දන්නවාද? අම්මට කොහොමද සිහිය නැති වුණේ කියලා.

ඒ කතාව ඇනා එවෙලෙ කිව්වා “ඔයා විශ්වාස කරන එකක් නැති වෙයි. ඔයා අර ෆොටෝ එකේ දැකල තියෙනව නේද තාත්තව?” ඇනා කිව්වා.

රෝස් කිව්වා “ඔව් මං තාත්තව දැකල තියෙනවා හැබැයි ෆොටෝ එකෙන්”

"ඒකනෙ අන්න ඒ ෆොටෝ එකේ ඉන්න එක්කෙනා අද ගෙදරට ආවා"

"අෑ බොරු කියන්න එපා අක්කේ"

"බොරු නෙවෙයි නංගි ඇත්ත. අද අපේ තාත්තා, අපේම තාත්තා ගෙදර ආවා" ඇනා කිව්වා.

ඒ මොකටද කියලා රෝස් ඇහුවා.

"එයා මෙච්චර දවස් මැරිලා කියලා කිව්වෙ බොරුලු. අම්මට තාත්තා මැරිල කියල තියෙන්නෙත් බොරු දෙස්තර කෙනෙක්ලු

"එතකොට තාත්තා මැරිල නැද්ද" රෝස් ඇහුවා.

"නෑ පිස්සුද? තාත්තට කවුද තර්ජනය කරල කොහෙදෝ ගල් ගුහාවක හිරකරගෙන ඉදලා"

"මොනව"? රෝස් කිව්වා.

"මොනව නෙවෙයි මං අහගෙන හිටියේ ඔය ඔක්කොම ටික අහගෙන හිටියෙ. ඊට පස්සෙ තමයි අම්මට සිහිය නැති වෙලා වැටුනෙ" ඇනා කිව්වා.

රෝස් කිව්වා "මං ගෙදරට එද්දිත් කවුදෝ මන්දා ගෑනු දෙන්නෙක් කතා කර කර හිටියා අපේ තාත්තා අයෙ ගමට ඇවිල්ල කියලා. මං හිතුවෙ මාව දැකල මාව පාච්චල් කරන්න කියනවා කියලා. ඒ නැතත් මට සැකයක් හිතුනා.

"මොකක්ද සැකේ' කියල ඇනා ඇහුවා.

රෝස් කිව්වා "සාමාන්‍යයෙන් මේසන් වැඩ එක දවසක් කරලා එක දවසකින් පපුවෙ අමාරු හැදෙන් නෑනෙ"

“ඕං පන්ඩිත ආච්චි ඇඟට වැහුනද?”

රෝස් අහුව “ඇයි මොකද මං කිව්වා කතාව වැරදිද?” රෝස් ඇහුවා.

“ඔව් වැරදිනෙ. ඔයා වැරදිම වැරදි. තාත්තාට පපුවෙ අමාරුව හැදිල නොවෙයිනෙ තාත්තගෙ කකුලට උදැල්ලෙන් තියුණු පහරක් වැදිලනෙ. ඔයා මේ වෙන මොනාදෝ පටලගෙන”

“ආ වෙන්න ඇති ”

හදිසියේම ගෙදර දොරට කවුදෝ තට්ටු කරනවා ඇහුණා. රෝස් කලබල වුණා. රෝස් කිව්වා ඇනාට “අක්කේ ඔයා ඉක්මනට ඔය කටහඬ වෙනස් කර ගන්න. ඉක්මනට... ඉක්මන් කරන්න .මං ගිහිං දොර අරින්නං”

නමුත් රෝස් දන්නැති ලොකු රහසක් තිබුණා. දැන් අපි බලමු මොකක්ද මේ රහස කියලා.

රෝස් ඉක්මනට ගිහින් දොර ඇරියා. දොර ඇරල බලද්දි හිටියෙ අල්ලපු ගෙදර නැන්දා අල්ලපු ගෙදර කිව්වට රෝස්ලගෙ ගෙදර කුස්සියට අල්ලපු පැත්තෙ තමයි අල්ලපු ගෙදර නැන්දල ඉන්නෙ. ඉතින් නැන්දා රෝස්ට කිව්වා “පුතේ ගෙදර මොනව හරි රොස් වෙනව වගේ නැද්ද” කියලා බලද්දි රෝස්ගෙයි ඇනාගෙයි කතාවෙන් කතාවට ලිපේ තිබ්බ මාලුවත් අමතක වෙලා. ඉතිං කොහොම හරි ඇනාට ඒක ඇහිල ඇනා ලිපේ තිබ්බ දර අයින් කරල වලද ලිපෙන් බෑවා.

බාල ඉවර වෙලා ඇනා ඇවිත් නැන්දට කීවා “නැන්දෙ දැන් හරි” කියලා.

ඔන්න දැන් අර රහස මතු වෙන්නයි යන්නෙ දැන් යං රහස බලන්න.

දැන් ඇනා නැන්දට කිව්වෙ ගොත ගහන් නැතුවනේ. රෝස්ට පුදුම හිතුනා රෝස් ඇනා ළඟට ගිහින් ඇනාගෙ අත මිරිකුවා. වෙන මොකකටවත් නෙමෙයි රෝස් දන්නෑනෙ මේ රහස. අන්න ඒ නිසයි.

රෝස් ඇනාගෙ අත මිරිකුවට ඊට පස්සෙ නැන්දත් හොඳට කතා කරා රෝස්ට හරි පුදුමයි.

රෝස් ඇහුවා දෙන්නගෙන්ම "ඔයාලා දන්නවාද" රෝස්ට කියන්න ලැබුනෙ එච්චරයි.

නැන්ද කීවා "ඔව් පුතේ ඔව් මම ඔක්කොම දන්නවා. මම විතරක් නෙමෙයි අපේ මුළු ගමම දන්නවා"

රෝස් කිව්වා "එතකොට මට අක්ක කිව්ව කතාව බොරුද"

අනේ පව් අර රෝස්ට පිස්සු වගේ. හිතන්න ඔයාට ගණන් පංති එක දවසක් යන්න බැරිවුණොත් එදා කරපු ගණන් ටික පහුවදාට කරද්දි ගණන් පැටලෙන විදිය. රෝස් හරිම පවු අනේ අසරණ රෝස්....

ඇනා ඇහුවා "මොකක්ද මං කිව්ව බොරුව"

"ඇයි ඔයාට පහ වසරෙදි මානසික ආබාධය අඩුවෙලා ඔයා හිතල රඟපෑවා කියල. බලන් ගියාම අම්මත් දන්නව වගේ පේන්නෙ" රෝස් කිව්වා.

ඊට පස්සෙ ඇනා කිව්වා "පෙන්නෙ නෙවෙයි. අම්මා තමයි මට කීවේ එහෙම රඟපාන්න කියල"

රෝස් ඊට පස්සෙ ඇහුවෙ නැන්දගෙන් "මං ගෙදරට එනකොට නැන්දගෙන් මොකද වුණේ කියල අහද්දි නැන්ද කිව්වෙ "ඇනා ගොත ගොතා ඇවිත් කිව්වෙ" කියල. "ඒ මොකටද එහෙම කිව්වෙ?"

නැන්ද කිව්ව "ඇනා දැකල තියෙනව රෝස් ගෙදර පැත්තට එනවා. ඒකයි එහෙම කිව්වෙ අනික ඇනාට හැමදාම ඉංග්‍රිසි උගන්වන්න ඔයාලගෙ ලොකු අම්මගෙ දුව ඇවිත්. දැන් ඇනාට හොඳට ඉංග්‍රිසි පුළුවන්." නැන්ද කිව්වා.

"ඔහොම කියද්දියි මතක් වුණේ පුතේ නරක ආරංචියක් තියෙනවා" නැන්දා කිව්වා.

ඇනායි රෝසුයි එකවර ඇහුවෙ "මොකක්ද" කියල.

බලනකොට අම්මගෙ අන්තිම හුස්මත් ගිහින්. ඒ මොකද දන්නවද අම්මට තාත්ත කිව්ව දේවල් දරා ගන්න බැරුව. කලිනුත් අපි දෙන්නවනෙ අම්ම මැරිල කියල අපි දැනගෙන හිටියත් මේ කට්ටිය මේක දැනගෙන නෙවෙයි ඉදල තියෙන්නෙ.

රෝසුයි ඇනායි හිතුව "එහෙනං අපිට අම්මත් නැතිවුණා".

එහෙම හිතපු මේ දෙන්නට තවත් ප්‍රශ්නයක්....

"ඇත්තටම තාත්ත කෝ?"

තාත්ත ඉන්නව ගමේ කොහෙහරි හැංගිල. ඒත් මේ ගෙදරට නම් එන්නෑ. මේ රෝස් සහ ඇනා මේක ප්‍රශ්නයක් කරගන්නැතුව අල්ලපු ගෙදර නැන්දට යන්න ඇරිය.

මේ දෙන්නා දුක නිවාගෙන, කාලා බීලා නිදාගත්තා පහුවදා උදාවුණා. පහුවදා රෝස්ලගෙ ගෙදරට ලිවුමක් ආවා.

ඒකෙ තිබ්බේ රෝස්ට විශ්ව විද්‍යාලයේ විශේෂ ශිෂ්‍යත්වයක් ලියල එයාට ජපන් රටට ගොස් ඉගෙන ගන්න අවස්ථාවක් ලැබුණා කියල. දෙන්නටම හරිම සතුටුයි ඊළඟ සතියෙ තමයි යන්න තිබ්බෙ. ඉතිං දෙන්නම ලෑස්තියි යන්න.

ගමේ හැමෝටම කියල මේ දෙන්නා රටත් ගියා. රට ගිහින් හොඳට ඉගෙන ගත්තා. ඇනා ජපන් රටේ හොඳ හෝටලයක වැඩ කරනවා. රෝස් හොඳට ඉගෙන ගන්නවා ඒ රටට හුරුවෙනවා. කතා බහ කරන්න දෙන්නම හුරු වෙනවා.

ටික කාලයක් ගත වුණා. හැබැයි තාත්තා ගැන හොයන විමර්ශන තාමත් ඉවර නෑ. ඒවා තවම තියෙනවා.....



**නිමි.**

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් විම වලක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරන ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්.
ව්‍යාපෘති නිර්මාතෘ